# රුහුණ විශ්වවිද්‍යාලය

## 2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 3000 ස්ථලය

## දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි

## SLS 32553/32653 - විශ්ව සාහිත්‍ය පරිචය

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය: පැය 03 යි.**

---

01. ජන සාහිත්‍යයේ සිට විශ්ව සාහිත්‍යය දක්වා සාහිත්‍යයේ වර්ධනය හා බැඳුණු සන්ධිස්ථාන පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් කරන්න.

02. "පුරාතන සිංහල ගද්‍ය සාහිත්‍යය කලාපීය සාහිත්‍ය සම්භාෂණයෙහි ප්‍රතිඵලයකි." ඔබේ අදහස් දක්වන්න.

03. "හර්මන් හෙසගේ **සිද්ධාර්ථ** යනු නූතන බටහිර සම්භාව්‍ය නවකතාවට නව මාන එක් කළ නවකථාවකි." විමසන්න.

04. "ආත්මීය නවකතාවක ලක්ෂණ දැකිය හැකි වුව ද අසිරිමත් මානව සබඳතා පිළිබඳ ගැඹුරු විවරණයක් **ගැහැණියකගේ චරිතාපදානය** නවකතාවෙන් සිදු වෙයි." පැහැදිලි කරන්න.

05. ඇල්බෙයර් කැමූගේ **අමුතුම මිනිහෙක්** නවකතාවෙහි එන මර්සෝගේ චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. "බහුදෘෂ්ටිකෝණ භාවිතය යනු අභියෝගාත්මක රචනෝපක්‍රමයකි." **ෆොන්ටමාරා** නවකතාව මේ අභියෝගයට මුහුණ දී ඇති ආකාරය පරීක්ෂා කරන්න.

07. "විවිධ කථා සන්දර්භ ඔස්සේ වුව ද සමාන තේමා ස්පර්ශ කරන නිර්මාණ, විශ්ව සාහිත්‍ය කෘති අතර දුලබ නො වේ." නිර්දිෂ්ට කෙටිකතා තුනක් අසුරෙන් උක්ත ප්‍රකාශය සාධනය කරන්න.

08. ප්‍රධාන චරිතය තාත්වික ව නිරූපණය කිරීම සඳහා 'අපර්ණාගේ' චරිතයෙන් ලැබී ඇති පිටුබලය කෙබඳු දැ යි අපූගේ ලෝකය නවකතාව ඇසුරෙන් පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.)

@@@@@@@@@@@@